චක්‍රලේඛ අංකය :35/2010

මාගේ අංකය:ඩී1/10/85/(111)
බන්ධනාගාර මූලස්ථානය.
2010.12.02

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්/සහකාර අධිකාරීවරුන්,

බන්ධනාගාරවල සිදුවන සිද්ධීන් දැනුම්දීම

බන්ධනාගාර ආයතන හා ඊට අනුබද්ධ ආයතන වලට අදාලව සිදුවන සිදුවීම් බන්ධනාගාර මූලස්ථානය වෙත වාර්තා නොකිරීම නිසා ගැටළුකාරී තත්ත්වයන්ට හා අපහසුතාවයන්ට බොහෝ අවස්ථාවලදී පත් වීමට සිදුව ඇත.එනම්

- මෙම සිදුවීම් සම්බන්ධව ජනමාධ්‍ය මගින් විමසන අවස්ථාවලදී පැහැදිලි කිරීම් හා නිවැරදි තොරතුරු ඔවුන් වෙත ලබා දීමට අපොහොසත් වන අතරම ඒ තුළින් වැරදි තොරතුරු ප්‍රචාරණය වීම් සිදුවේ. එසේ වැරදි තොරතුරු ප්‍රචාරණය වූ පසු නිවැරදි කිරීම ඉතාමත් අපහසු කාර්යභාරයකි.
- විෂයභාර ඇමතිවරයා හෝ එවැනි වගකිව යුතු නිළතල දරන්නන් විසින් ඒ පිළිබඳ විමසීමේදී මා නොදැනුවත්ව සිටීම නිසා කරුණු ඉදිරිපත් කිරීමට නොහැකිවීම තුළින් දෙපාර්තමේන්තු නාමයට හානියක් සිදුවනු ඇත.

එබැවින් මින් ඉදිරියේදී සිද්ධිය සිදු වූ වහාම මා වෙත දුරකථනයෙන් දැන්වීමට කටයුතු කර හැකි ඉක්මනින් ලිඛිත වාර්තාවක් එවීමට වගබලා ගත යුතුය.
එසේ අදාල සිද්ධීන් පිළිබඳ මා දැනුවත් කිරීමට අපහසු වන්නේ නම් පමණක් බන්ධනාගාර කොමසාරිස්වරයෙකු දැනුවත් කළ යුතු බව දන්වා සිටිමි.

.....................................................

වී.ආර්.සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩියූ අයිපී
මේජර් ජෙනරාල්